**විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතිය - 2019**

----------------------------------------------------------------------------------------------------

විදුලිබල සැපයුම් විශ්වසනීයත්වය වැඩි දියුණු කිරීම සඳහා සහාය වීමේ ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය හා ආසියානු සංවර්ධන බැංකුව අතර 2016 දෙසැම්බර් 19 දින එළඹි අංක. 0486-එස්ආර්අයි දරන ප්‍රදාන ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ප්‍රදාන ගිවිසුමට අනුව, විදුලිබල සහ බලශක්ති අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. බස්නාහිර පළාතේ පුනර්ජනනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතියක් ඉදි කිරීම මගින් දෙමුහුන් පුනර්ජනනීය බලශක්ති පද්ධති ස්ථාපනය කිරීමට සහාය ලබා දීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. පුනර්ජනඑනීය බලශක්ති ක්ෂුද්‍ර බෙදා හැරීම් පද්ධතියක් ස්ථාපනය කිරීම නම් වූ සංරචකය යටතේ ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කෙරේ. ප්‍රදාන ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 268.36 කට සමාන එජඩො මිලියන 1.8 ක් වන අතර එම මුළු මුදලම ආසියානු සංවර්ධන බැංකුව විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය මගින් එහි කටයුතු 2017 ජූනි 29 දින ආරම්භ කර ඇති අතර 2021 සැප්තැම්බර් 30 වන විට එම කටයුතු අවසන් කිරීමට සැලසුම් කර ඇත.

## 1.3 මතය

මේ සමඟ වූ මූල්‍ය ප්‍රකාශ මගින් 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතියේ මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විසින් මෙම විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. කාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රමාණාත්මක සාවද්‍යප්‍ර බල වන අතරප්‍ර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2.** **කොන්ත්‍රාත් පරිපාලනය**

| විගණන නිරීක්ෂණය | අවදානම් ශ්‍රේණිගත කිරීම් | බලපෑම | කළමනාකාරීත්වයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| පුනර්ජනනීය බලශක්ති මයික්‍රෝ ග්‍රිඩ් නියමු ව්‍යාපෘතිය සැලසුම් කිරීම, ඉදිකිරීම, ස්ථාපනය කිරීම සහ ආරම්භ කිරීම සඳහා තෝරාගත් ලංසුකරු මයික්‍රෝ ග්‍රිඩ් පද්ධතියේ වසර දෙකක ක්‍රියාකාරීත්වය සඳහා අනිවාර්ය අමතර කොටස් සඳහා මිල ගණන් සඳහන් කර නොමැත. කෙසේ වෙතත්, තාක්ෂණික ඇගයීම් කමිටුව කොත්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර ඉහත ලංසු අයිතමයට අදාළ එකඟතාවයකින් යුත් විසඳුමකට යටත්ව ලංසුව නිර්දේශ කරන ලදි. පසුව, 2020 පෙබරවාරි 11 වන දින කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණේ කොන්ත්‍රාත්කරු විසින් මිල ගණන් දක්වා ඇති අනෙකුත් අනිවාර්ය අමතර කොටස් සඳහා වසර දෙකක් හෝ ඊට වැඩි වගකීමක් ලබා දී ඇති බැවිනි. | මධ්‍යස්ථ | ව්‍යාපෘති පිරිවැය අනවශ්‍ය ලෙස වැඩි විය හැක. | කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීමට පෙර කොන්ත්‍රාත්කරු සමඟ පැවති රැස්වීමකදී මේ පිළිබඳව සාකච්ඡා කෙරුණි. කොන්ත්‍රාත්කරු සඳහන් කළ උපකරණ සඳහා වසර දෙකක හෝ ඊට වැඩි වගකීම් සහතිකයක් ලබා දී ඇති බැවින්, වසර දෙකක අමතර කොටස් සඳහා වන පිරිවැය ද පිරිනැමීම සමඟ ඇතුළත් වන බව සැලකේ. | මයික්‍රෝ ග්‍රිඩ් පද්ධතියේ වසර දෙකක ක්‍රියාකාරීත්වය සඳහා අනිවාර්ය අමතර කොටස් සැපයීමට ලංසුකරු බැඳී සිටින බැවින් සැපයුම්කරු එකඟ වූ කාල සීමාවන් සඳහා වගකීමක් සමඟ මෙම කරුණ සලකා බැලිය යුතුය. |